ලියා පදිංචි තැපෑලෙනි

දුලාංජලි ජයකොඩි මහත්මිය,
අංක 93,
විජේරාම මාවත,
කොළඹ 7.

2023 ක්වු අප්‍රේල් මස 28 වෙනි දින දිය.

ඩයනා ගමගේ මහත්මිය,
අංක 537/21,
කන්ට්‍රි ග්ලේඩ් බංගලාව
අමරගොඩ පාර, පොතු අරාව,
හෝකන්දර උතුර.

මා මෙම ලිපිය මගින් ඔබ වෙත දන්වා සිටිනුයේ ඔබ විසින් 2023 අප්‍රේල් මස 27 වෙනි දින පාර්ලිමේන්තුව තුලදි සිදු කරන ලද උද්දේශික ප්‍රකාශය තුළින් වෙනත් කරුණු අතර බැංකුවේ මුදල් තැන්පත් කිරීම සඳහා මා විසින් මුදල් නෝට්ටු මුද්‍රණය කිරීමේ නිති විරෝධි ක්‍රියාවකට සම්බන්ධ වූ බවට සහ/ හෝ අවධාරණය කරමින් සිදු කරන ලද ප්‍රකාශය සම්බන්ධයෙනි.

කොළඹ ගරු මහාධිකරණයේදි අසා විනිශ්වය කරන්නට යෙදුන අංක HC/8378/15 දරණ නඩුවේ කරුණු සම්බන්ධයෙන් ඔබ කතා කිරීමට තිරණය කර ඇති හෙයින්, එච් එම් ඒ කේ ආර් එම් පෙරේරා මහතා ව්‍යාජ මුදල් මුද්‍රණය කොට ඔහු විසින් මා වෙත ගෙවිය යුතුව තිබූ ව්‍යාපාරික ගණුදෙනුවකට අදාලව ගෙවීම් සිදු කිරීමේදි, එකි ව්‍යාජ මුදල් වලින් මා වෙත ගෙවීමට අදාලව 2017 මැයි මස 22 වෙනි දින ඔහුව වැරදි කරු වී ඇති බව ඔබ වෙත දන්වා සිටිමි. තවද එකි නඩුවෙන් 2017 ජුලි මස 21 වෙනි දින එකි වුදිත විසින් මා හට වන්දි වශයෙන් රුපියල් මිලියන දෙකක (රු.2000000/-) මුදලක්ද ගෙවා ඇති බවද ඔබ දන්නවා ඇත.

ඔබ රාජ්‍ය අමාත්‍ය ධුරයක් දරමින් සිටින කෙනෙකු හෙයින් වෘත්තියමය සහ ගෞරවනිය ලෙස වගකිමෙන් යුක්තව හැසිරීම ඔබ වෙත තිබිය යුතු ගුණාංගය විය යුතු වන්නේය. පාර්ලිමේන්තු වරප්‍රසාද වලට මුවාවි මට විරුද්ධව අසත්‍ය හා හානිදායක ප්‍රකාශයන් සිදු කිරීම නිවට හා සදාචාර විරෝධි

ක්‍රියාවකි.ගරු මහාධිකරණය විසින් ලබා දී ඇති අධිකරණ තීන්දුව ඔබේ අරමුණට ගැලපෙන පරිදි නීති විරෝධී ලෙස අර්ථ කථනය කිරීමට උත්සාහ කරන්නේද?

ඔබ විසින් මට එරෙහිව සිදු කර ඇති චෝදනා අසත්‍ය මෙන්ම පළිගැනීමේ සහ පදනම් විරහිත ඒවාය . එකී චෝදනාත්මක ප්‍රකාශය පාර්ලිමේන්තු සභා ගැබෙන් පිටතදී සිදු කරන ලෙසට ඔබට මෙයින් අභියෝග කරමි. මා පාර්ලිමේන්තු මන්ත්‍රීවරියක් නොවන නිසා පාර්ලිමේන්තුව තුලදී ඔබගේ පිස්සු කෙලිම් වලට මට එහිදී උත්තර ලබා දීමට නොහැකිය. ඔබට මෙම කරුණ සම්බන්ධයෙන් වැඩිදුර පැහැදිලි කර ගැනීමක් අවශ්‍ය වන්නේ නම් මාගේ නීතිඥ කණ්ඩායම හෝ මාව සම්බන්ධ කර ගෙන විමසා සිටිය හැකිය.

ඔබ විසින් මාගේ හොඳ නම කැත කිරීමට ව්‍යාජ ලෙස උත්සාහ කර ඇති බැවින්, ඔබ මාගෙන් සමාව ගැනීම යහපත් ක්‍රියාවකි. කෙසේ වෙතත් එය ඔබට ඉතා අපහසු කාර්යයක් බව හැගී යන්නේ නම් ඔබගේ විශ්වසනීයත්වය සහ අවංකභාවය හැමෝටම දැක ගැනීම ප්‍රශ්ණාර්ථයක් වනු ඇති බව මට අවබෝධ වේ. ඔබ වීදුරු නිවසක ජීවත් වෙමින් මිනිස්සුන්ට ගල් නොගැසිය යුතු බව ඔබ විසින් ඉගෙන ගනු ඇතැයි මා බලාපොරොත්තු වෙමි.

දුලාංජලී ජයකොඩි